**කොටපොළ ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**
**-------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 16 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 30 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට කොටපොළ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 1.3.1. ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) කර්මාන්තයක් වෙනුවෙන් ලැබිය යුතු රු.202,038 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) කර්මාන්ත 17 ට අදාළව ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර රු.1,252,347 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) කර්මාන්ත 13 කට අදාළව ගෙවිය යුතු ප්‍රාග්ධන වියදම් රු.1,032,694 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ජල ව්‍යාපෘති 5 ක් සංවර්ධනය කිරීම සඳහා වැයකර තිබුණු රු.1,749,080 ක මුදල සහ සභාවට අයත් කඩ කාමර 25 ක් ඉදිකිරීමේ වටිනාකම වූ රු.2,931,436 ක මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඉ) රු. 99,000 කට තක්සේරු කර තිබුණු අත්ට්‍රැක්ටරය ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඊ) කොටපොළ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් අනුමත කර තිබුණු මුද්දර ගාස්තු ආදායම රු.1,173,130 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) අවසන් තොග ශේෂයන්ගේ එකතු වටිනාකම රු.107,446 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඌ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.4,289,585 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි.

### 1.3.2 නොසැසඳුණු ගිණුම්

---------------------

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.17,148,154 ක් වූ ගිණුම් විෂයයන් 08 කට අදාළ ශේෂ සහ ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර වූ අසමානතා එකතුව රු.3,732,292 ක් විය.

### 1.3.3 අවිනිශ්චිත ගිණුම

--------------------

ගිණුම්වල ඉදිරියට ගෙනමින් පවතින රු.255,674 ක්වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

### 1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්

--------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.68,509,349 ක් වූ කර්මාන්ත ණයගැති ශේෂය තුළ, වර්ෂ 03 ක කාලයක් ඉක්මවා තිබූ රු.28,345,374ක් වූ ශේෂ ඇතුළත් වී තිබුණි.

(ii) වසර 10 ක කාලයක් ඉක්මවා තිබුණු ලැබිය යුතු විනෝද බදු ශේෂය රු.419,131 ක් විය.

(iii) ඉකුත් වර්ෂය අවසානයට ප්‍රාග්ධන ණයගැති ශේෂය තුළ පැවති අවුරුදු 03 ක කාලයක් ඉක්මවා තිබූ රු.19,167,306 ක ශේෂය හඳුනාගෙන නිරවුල්කර ගැනීමට කටයුතු නොකර ගිණුම්වලින් ඉවත් කර තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.68,012,008 ක් වූ ප්‍රාග්ධන ණයහිමි ශේෂය තුළ, වර්ෂ 03 ක කාලයක් ඉක්මවා තිබූ රු. 28,995,075 ක ශේෂ ඇතුළත් වී තිබුණි.

### 1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

---------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 11,767,835 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.6 අනුකූල නොවීම**

**--------------------------**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

------------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ප්‍රාදේශීය සභා පනතේ 140 (1) වගන්තිය | වරිපනම් බදු ගෙවනු ලබන 761 දෙනෙකු විසින් 2005 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සිදුකල නව ඉදිකිරීම්වලට අදාළව දේපළ තක්සේරු කර, නව තක්සේරු වටිනාකම අනුව වරිපනම් බදු අයකර ගෙන නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 33 | වරිපනම් බදු ගෙවීම් පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තු සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු ලැයිස්තු පිළියෙළ කර ඊට අදාළ පියවර ගෙන නොතිබුණි. |
| (ii) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ගිණුම සමඟ ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) රීති 199 | පොදු ගබඩා සහ ජල ගබඩා තොග ලේඛනවල ලැබීම්වලට අදාළ සෑම සටහනක් ඉදිරියෙන්ම භාණ්ඩ සඳහා මුදල් ගෙවන ලද වවුචරයේ අංකය හා දිනය සටහන් කර නොතිබුණි. |
| (iv) රීති 218 | සභාව සතු සියළුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ වාර්ෂික සමීක්ෂණ පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මුදල් රෙගුලාසි 110 | හානි හා පාඩු පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. |

| | |
|---|---|
| (ii) මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 ක කාලයක් ඉක්මවූ එකතුව රු.5,124,146 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.15,701,806 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.17,796,793 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

----------------------

**2.2.1** **ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,477,000 | 1,373,838 | 1,362,574 | 790,655 | 1,383,000 | 1,539,233 | 1,608,584 | 779,391 |
| කුලී | 6,998,000 | 5,007,233 | 5,306,819 | 156,810 | 9,096,500 | 5,531,840 | 5,309,029 | 456,396 |
| බලපත්‍ර ගාස්තු | 928,000 | 1,666,499 | 1,582,209 | 84,290 | 803,000 | 800,687 | 800,687 | - |
| වෙනත් ආදායම් | 19,014,200 | 20,743,816 | 14,314,710 | 26,930,617 | 15,669,000 | 22,267,431 | 13,701,487 | 20,501,511 |
| -එකතුව- | 28,417,200 | 28,791,386 | 22,566,312 | 27,962,372 | 26,951,500 | 30,139,191 | 21,419,787 | 21,737,298 |

**2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

**-------------------------------------**

සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත කළ මුළු ආදායම රු.28,417,200 ක් වූ අතර බිල් කළ ආදායම රු.28,791,386 ක් විය. රු.21,737,298 ක් වූ ආරම්භක හිඟය සමඟ අයවිය යුතු මුළු මුදල රු.50,528,684 ක් වුවද, වර්ෂය තුළ රැස්කළ මුළු ආදායම රු.22,566,312ක් වීමෙන් වර්ෂය අවසානයට මුළු හිඟය රු.27,962,372ක් වී තිබුණි.

**2.2.3 වරිපනම් හා බදු**

**-----------------**

(අ) වරිපනම් බදු

-------------

ආරම්භක හිඟය රු.149,251 ක් වූ අතර, රු.157,054 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.306,305 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.144,396 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.161,909 ක හිඟ ශේෂයක් පැවතුණි.

(ආ) අක්කර බදු

------------

ආරම්භක හිඟය රු.211,008 ක් වූ අතර, රු.49,069 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.260,077 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.50,462 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.209,615 ක් හිඟව පැවතුණි.

**2.2.4 කුලී**

------

**(අ) කඩ කුලී**

**---------**

ආරම්භක හිඟය රු.102,925 ක් වූ අතර, රු.1,457,000 ක් වූ බිල්කිරීම් සමග රු.1,559,925 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු. 1,519,350 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.40,575 ක් හිඟව පැවතුණි.

**(ආ) පොළ මාළු ලැලි බදු කුලී**

---------------------------

ආරම්භක හිඟය රු.330,080 ක් වූ අතර, රු.2,619,596 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.2,949,676 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.2,841,241 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.108,435 ක් හිඟව පැවතුණි.

**2.2.5 වෙනත් ආදායම්**

**-----------------**

**(අ) ජල ගාස්තු**

**----------**

ආරම්භක හිඟ ශේෂය රු.1,792,723 ක් වූ අතර, රු.3,396,730 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.5,189,453 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.3,141,544ක් වීම නිසා වර්ෂය අවසානයට රු.2,047,909 ක හිඟ ශේෂයක් පැවතුණි.

(ආ) **දැන්වීම් පුවරු ගාස්තු**

2016 වර්ෂයේ සිට පැවත එන දැන්වීම් පුවරු ගාස්තු රු.185,200 ක් අයකර නොතිබුණි.

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.2,726,642 ක් හා මුද්දර ගාස්තු රු.22,157,826 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිලිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **ක්‍රියාකාරී සැළැස්ම**

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) **අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

පළාත් නැගුම වැඩසටහන යටතේ දෙනියාය නව පොළ ඉදි කිරීම සඳහා භූමිය පස් දමා සකස් කිරීම වෙනුවෙන් රු.30,130,327 ක් 2017 දෙසැම්බර් 31 දින වන විට වැය කර තිබුණි. රු.28,296,801 ක වටිනාකමට ඇස්තමේන්තු කර තිබූ ගොඩනැගිල්ල ඉදිකිරීමට වසර 3 ක කාලය තුළ නොහැකිවීම නිසා දරන ලද වියදම නිශ්කාර්ය වී තිබුණි. එමෙන්ම පොළ පවත්වා ගැනීමට වෙනත් ඉඩමකට එම වසර 03 සඳහා රු.360,000 ක මුදලක් ගෙවා තිබුණි.

(ඇ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් ඝන අපද්‍රව්‍ය කිලෝග්‍රෑම් 1,825,000 ක් එකතු කර තිබුණු අතර, ඉන් කිලෝග්‍රෑම් 338,162 ක් පොහොර නිෂ්පාදනය සඳහා යොදා ගෙන තිබුණි. ඉතිරි අපද්‍රව්‍ය අක්‍රමවත් ලෙස පරිසරයට මුදා හැර තිබුණි.

(ii) සභාව විසින් කසළ කළමනාකරණය වෙනුවෙන් වර්ෂය තුළ රු.3,632,870 ක් වියදම් දරා පොහොර කිලෝග්‍රෑම් 9488 ක් නිෂ්පාදනය කර තිබූ අතර, පොහොර අලෙවියෙන් රු.105,996ක් උපයාගෙන තිබුණි.

**(ඇ) පාරිසරික ගැටළු**

2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව පරිසර බලපත්‍රයක් ලබාගත යුතු ව්‍යාපාර ආයතන 104 ක් පරිසර බලපත්‍ර ලබා නොගැනීම හේතුවෙන් සභාවට රු.416,000 ක ආදායමක් අහිමි වී තිබුණු අතර, පරිසර බලපත්‍ර ලබා නොගැනීමෙන් පරිසරයට හා මහජනයාට සිදුවන හානිය පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි.

**(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක**

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ , තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

## 3.2 මානව සම්පත් කළමනාකරණය

**සේවක පුරප්පාඩු හා අතිරික්ත**

(i) සේවක සංඛ්‍යා සැළැස්මේ අනුමත ද්විතීයික හා ප්‍රාථමික තනතුරුවල පැවති පුරප්පාඩු 03 ක් හා 21 ක් වූ අතිරික්තයන් සම්බන්ධව විධිමත් පියවර ගෙන නොතිබුණි.

(ii) අනුමත සීමාවට අමතරව බඳවාගෙන තිබුණු සේවකයින්ගේ වැටුප් හා දීමනා ගෙවීම සඳහා සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලින් රු. 1,777,172 ක් වැයකර තිබුණි.

## 3.3 වත්කම් කළමනාකරණය

### 3.3.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

ගිණුම්වල ඇතුළත් රු.13,681,188 ක් වටිනා ඉඩම් 05 ක් සහ වටිනාකම සඳහන් නොවූ ඉඩම් 06 ක් ඇතුළුව ඉඩම් 11 ක අයිතිය තහවුරු කරගෙන නොතිබුණි.

### 3.3.2 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

වටිනාකම රු.8,300,000 ක් වූ ගොඩනැගිලි 02 ක් සහ වටිනාකම සඳහන් නොවූ ප්‍රජාශාලා 02 ක් ඉකුත් වර්ෂවල සිට කිසිදු ඵලදායී කටයුත්තකට යොදාගෙන නොතිබුණි.

### 3.3.3 වාර්ෂික භාණ්ඩ තොග සමීක්ෂණය

ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 217 සහ 218 අනුව වාර්ෂිකව කළයුතු ඉඩම් ගොඩනැගිලි සමීක්ෂණය 2015 වර්ෂයෙන් පසු සිදුකර නොතිබුණි.

### 3.4 අවිධිමත් ගණුදෙනු

----------------------

ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලවලින් 2012 වර්ෂයේ සභාවට ලැබිය යුතුව තිබූ රු.28,880,175 ක් වූ මුද්දර ගාස්තු ආදායම ලබාගැනීම වෙනුවෙන් නිලධාරීන් 09 දෙනෙකුට දිරි දීමනා ලෙස රු.846,405 ක මුදලක් ගෙවා තිබුණි.

### 3.5 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

රුහුණු සංචාරක කාර්යාංශයේ ප්‍රතිපාදන මත සත්මහල් ඇල්ල ප්‍රවේශ මාර්ගයක් ඉදි කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය නොකර රු.1,889,671 ක හා රු.1,890,394 ක කොන්ත්‍රාත් 02 ක් එකම කොන්ත්‍රාත්කරුවෙකුට පිරිනමා තිබුණි. කර්මාන්ත 02 සඳහා රු.3,761,142 ක මුදලක් ගෙවීම අනුමත කර තිබුණද, මෙම කර්මාන්තයේ අන්තර් සම්බන්ධිත කුට්ටිගල් පරීක්ෂාවේදී එම ගල්වලින් සියයට 70 ක් නියමිත ප්‍රමිතියට අනුකූල නොවන බව නිරීක්ෂණය විය.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

### 4.1 අයවැය පාලනය

------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) වැය විෂයයන් 08 ක එකතුව රු.13,888,451 ක් වූ ඉතිරිවීම් දක්නට ලැබුණු අතර, එම අගයන් සියයට 11 සිට සියයට 76 දක්වා පරාසයක පැවතුණි.

(ආ) ආදායම් විෂයයන් 04 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.9,107,922 ක් වූ අතර, එම අගයන් සියයට 7 සිට සියයට 41 දක්වා පරාසයක පැවතුණි.

(ඇ) ආදායම් විෂයයන් 03 ක හිතකර විචලනයන්ගේ එකතුව රු.3,725,675 ක් වූ අතර, එම අගයන් සියයට 18 සිට සියයට 80 දක්වා පරාසයක පැවතුණි.

## 5. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම්

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) අයවැය පාලනය

(ඈ) ගිණුම්කරණය